# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2378/14 – 2024 අප්‍රේල් මස 02 වැනි අඟහරුවාදා – 2024.04.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/349.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2346/13 දරන හා 2023.08.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙස, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, අංක 356, සංවර්ධන ලොතරැයි මණ්ඩලය හි මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය සමිතිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙස, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, අංක 356 හි පිහිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබාදී ඇති අංක A 72/2022 දරන හා 2023.07.31 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 72/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.08.21 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්. *(වැ.බ.)*

2024 මාර්තු මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත,
යූනියන් පෙදෙස , කොළඹ 02.

දිනය : 2024 පෙබරවාරි මස 26 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි,

2023 අගෝස්තු මස 21 දිනැති අංක 2346/13 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය සංගමය බැඳී සිටින්නාවූ ද, 2023 ජූලි මස 31 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සභාපති /ප්‍රධාන විධායක,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,

*පිටපත* : (අනෙක් පාර්ශ්වය)
මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය සංගමය
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක 356, කොල්වින් ආර්. ද සිල්වා මාවත,
යූනියන් පෙදෙස, කොළඹ 02.

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 04 – 0015

---

මගේ අංකය: IR/COM/02/2021/154.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2355/17 දරන හා 2023.10.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 12, මිරානියා වීදිය, බී. සී. සී.පරිශ්‍රය, අංක 21, ප්‍රසම්පාදන අංශය, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවහි ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 12, මිරානියා වීදිය, බී. සී. සී. පරිශ්‍රය, අංක 21 හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන්, බේරුම්කරු විසින් ලබා දී ඇති

අංක A 73/2022 දරන හා 2023.09.06 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 73/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.10.24 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැ.බ.)*

2024 මාර්තු මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 51 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව,
අංක 257,
සිරිධම්ම මාවත,
කොළඹ 10.

දිනය : 2023 නොවැම්බර් මස 16 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල්තුමා,

2023 ඔක්තෝබර් මස 24 දිනැති අංක 2355/17 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද අංක A /73/2022 දරන ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව බැඳී සිටින්නා වූ ද 2023.09.06 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එන්. පී. ජිනසේන,
සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව,

*පිටපත්* : (අනෙක් පාර්ශ්වය)
ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිති, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 04 – 0016

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.